# මිසර හෙවත් ඊජිප්තු ශිෂ්ටාචාරයෙන් හමු වන සිතුවම් කලාවේ නිරූපිත වස්ත්‍ර සහ ආභරණ පිළිබඳ අධ්‍යයනයක්

කේ. නිමාෂා කරුණාතිලක, එස්. ජී. එම්. ප්‍රියංකර, පී. වී. රුවනි චතුරිකා, දීපානි ජයතිලක[1]

පුද්ගලයාගේ තරාතිරම, බලය අනුව එක් එක් පුද්ගලයා හඳුනාගැනීමට හැකි සාධකය වන්නේ වස්ත්‍රාභරණ ය. ඒ අනුව මිසර සිතුවම් කලාවේ ද රජවරුන් පූජකවරුන් ප්‍රභුවරුන් ආදි ඉහළ පැලැන්තිය නියෝජනය කරන්නන් සාමාන්‍ය ජනතාවගෙන් වෙන් කොට හඳුනාගැනීමට උපකාරවත් වන්නේ ද වස්ත්‍රාභරණ යි. රජවරුන් ප්‍රභුවරුන් විශාල ගෙල මාල, ශිර්ෂාභරණ, ගෙල සිට දෙපා තෙක් වැසුණු වස්ත්‍රය, බොරු රැවුල ආදි අලංකාර වස්ත්‍රාභරණ සහිත ව දක්වා ඇත. සාමාන්‍ය ජනයා කුඩා ආභරණ, ඉරි සහිත යටිකය පමණක් හෝ සම්පූර්ණ ශරීරය වැසුණු වස්ත්‍ර සහිත ව දක්වා ඇත. මිසර සිතුවම් කලාවේ අවශේෂ මිසරය පුරා විවිධ ස්ථානවලින් හමු වී ඇත. ඒ සිතුවම් හමු වන ස්ථාන අනුව වර්ගීකරණය කොට අධ්‍යයනය කළ හැකි ය. ඒ අනුව පිරමීඩ ඇතුළතින් හමු වන සිතුවම්, රජ මාළිගා ආශ්‍රිත ව හා දේවස්ථාන ආශ්‍රිත ව හමු වන සිතුවම් ප්‍රධාන කොට දැක්විය හැකි ය. ආගම, රාජ්‍යත්වය, කෘෂිකර්මාන්තය, දඩයම, මළවුන්ගේ චාරිත්‍ර, මිත්‍යා විශ්වාස ආදිය ඒවාට වස්තු විෂය වී ඇත. ඒ සිතුවම්හි වස්ත්‍රාභරණ අධ්‍යයනය මඟින් ද ඒ ඒ කාර්ය සහ අවස්ථා පහසුවෙන් හඳුනාගත හැකි වේ. මෙසේ හමු වන සිතුවම්හි දක්නට ලැබෙන පුද්ගලයන් සමාජ වර්ගීකරණය කිරීමෙන් ද ඒ ඒ පුද්ගලයන්ට ආවේණික වස්ත්‍ර හා ආභරණ පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි ය. ස්ත්‍රී රූප දැක්වීමේ දී ගෙල මාල, බාහු වළලු, ශිර්ෂාභරණ, ගෙල සිට දෙපතුල් තෙක් වැසුණ රැලි සහිත හෝ රහිත වස්ත්‍රය දක්වා ඇත. පුරුෂ රුව දැක්වීමේ දී ඇතැම් අවස්ථාවල යටි කය පමණක් වැසුණු වස්ත්‍ර දක්වා ඇති අතර ඇතැම් විට ගෙල සිට පාදාන්තය දක්වා වැසුණු වස්ත්‍රය ද දක්වා ඇත. ගෙල මාල, බාහු වළලුවලට අමතර ව බොහෝ අවස්ථාවල පුරුෂ රූපය දැක්වීමේ දී විශාල, සත්ත්වයකුගේ හිසට සමාන ශිර්ෂාභරණ දැක්වීම විශේෂත්වයකි. මිසර චිත්‍ර ශිල්පියා සිතුවම් නිර්මාණයේ දී එක් එක් පුද්ගලයාගේ වස්ත්‍ර හා ආභරණවලට යම් අර්ථයක් සපයමින් නිර්මාණය කරන්නට උත්සාහ ගත් වග පැහැදිලි වේ. එයට හොඳ ම උදාහරණය වන්නේ කා නැමැති ආත්මය කවර සිතුවමක වුව ද එක ම ආකාරයට දැක්වීමෙන් එය හඳුනාගැනීමට පහසු කරවීම ය. එමෙන් ම විවාහක අවිවාහක බව, සමාජ තත්ත්වය, දේවත්වය, ආත්ම, මිත්‍යා රූප ආදිය වෙන වෙන ම ඒවාට ආවේණික වස්ත්‍රාභරණ මඟින් දක්වා ඇත. රජු කේන්ද්‍රගත දේශපාලනය, පූජකවරුන් මූලික කොටගත් ආගම, කෘෂිකර්මාන්තය, දඩයම මත පදනම් වූ ජීවනෝපාය, මිත්‍යා විශ්වාස, දියුණු කලාත්මක හැකියා, මළවුන්ගේ චාරිත්‍ර ආදි සියලු අංගවලින් පෝෂණය වූ ශිෂ්ටාචාරයක් ලෙස මිසර ශිෂ්ටාචාරය හඳුනාගැනීමට මිසර සිතුවම්වලින් දැක්වෙන වස්ත්‍රාභරණ මනා පිටුවහලක් වන්නේ ය.

**ප්‍රමුඛ පදඃ** ඊජිප්තු ශිෂ්ටාචාරය, සමාජ තත්ත්වය, වස්ත්‍රාභරණ, මිසර සිතුවම් කලාව

[1] දෘශ්‍ය කලා සැලැසුම්කරණය සහ ප්‍රාසඟිංක කලා ඒකකය, ලලිත කලා අධ්‍යයනාංශය